2026.03.10

සියලුම සේවකයන් වෙත,

2026 මාර්තු 08 දිනැති ලංවිම වෘත්තීය සමිති 25 විසින් ඉදිරිපත් කළ යෝජිත සාමූහික ගිවිසුමෙහි වගන්ති පිළිබඳව අද (10) දින, EGL, EDL, NSO & NTNSP අධ්‍යක්ෂ මණ්ඩල සමග පැවති සාකච්ඡාවේදී එකඟ වූ පරිදි පහත වගන්ති යටතේ ඇති කරුණු බලශක්ති ඇමතිවරයා සමග සාකච්ඡා කළ අතර ඔහුගේ අනුමැතිය ලබා දෙන ලදී.

- 6.1 වගන්තිය යටතේ රු. 1,000/= සහ රු. 10,000/= දීමනාව අඛණ්ඩව ලබා දෙන අතර 6.6 වගන්තියේ සඳහන් ජීවන වියදම් දීමනාවද එයට එකතු කර රජයේ අනුමත ජීවන වියදම් දීමනාව ලෙස සංයුක්තව ගෙවනු ඇත.
- 7.1 වගන්තිය යටතේ ඔබ ඉල්ලා ඇති වාර්ෂික ප්‍රසාද දීමනාව සඳහා නව සමාගම් විසින් කාර්ය සාධන පදනම්ව ගෙවීම් සිදු කරන තෙක් ලංවිම විසින් දැනටත් ලබා දෙන වාර්ෂික ප්‍රසාද දීමනාව ලබා දෙනු ඇත.
- 10.8 වගන්තියේ ඉල්ලා ඇති විශ්‍රාම හිමිකම් දීමනා පිළිබඳව ධනාත්මකව සලකා බැලීමට CEBEF සමාගමට උපදෙස් ලබා දීමට අමාත්‍යාවරයා එකඟ විය.

ඉහත සියල්ල සලකා බලා විදුලිය සැපයුම අත්‍යාවශ්‍ය සේවාවක් කර ඇති මොහොතක මහජනතාව අපහසුතාවයට පත් කරන අයුරින් දැනට ක්‍රියාත්මක කරන වෘත්තීය ක්‍රියාමාර්ග වහාම නවතා දෛනික රාජකාරි සිදු කිරීමේ එකඟතාවය මත, ගරු ජනාධිපතිතුමා සමග ඉදිරි දින දෙක තුළ සාකච්ඡාවක් සූදානම් කිරීමටත් එහිදී 12.1 වගන්තිය යටතේ ඉල්ලා ඇති වැටුප් වැඩිවීම පිළිබඳ සාකච්ඡා කර අවසන් තීරණය ගැනීමටත් බලශක්ති අමාත්‍යාවරයා එකඟ විය.

අනෙකුත් සියලුම කරුණු අද උදෑසන පැවති සාකච්ඡාවේදී එකඟ වූ පරිදි සංශෝධනය කර අත්සන් කිරීමට මින් එකඟ වේ.

සභාපති	සභාපති	සභාපති	සභාපති
EGL	EDL	NSO	NTNSP